# කාර්යසාධන වාර්තාව
# 2024

## කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

# පටුන


| පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|
| **01: ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය** | | |
| 1.1 | හැඳින්වීම | 1 - 1 |
| 1.2 | දැක්ම හා මෙහෙවර | 2 - 2 |
| 1.3 | පරමාර්ථ, ප්‍රධාන ක්‍රියාවන් හා ප්‍රධාන කාර්යයන් | 2 - 3 |
| 1.4 | සංවිධාන සටහන | 4 - 4 |
| **02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | | |
| 2.1 | රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම | 5 - 8 |
| 2.2 | රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම | 8 - 10 |
| 2.3 | ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම | 10 - 10 |
| 2.4 | අභියෝග සහ අනාගත අරමුණු | 11 - 11 |
| **03: 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | | |
| 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 12 - 12 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 13 - 13 |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 14 - 14 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 15 – 15 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 15 - 15 |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 15 - 15 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 15 - 15 |
| 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 16 - 16 |
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 16 - 16 |
| **04: කාර්ය සාධන දර්ශක** | | |
| 4.1 | ආයතනයේ කාර්ය සාධන දර්ශක | 17 - 17 |

| පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|
| **05: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** | | |
| 5.1 | හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු | 18 - 19 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 19 - 19 |
| **06: මානව සම්පත් පැතිකඩ** | | |
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 20 - 20 |
| 6.2 | ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය | 20 - 20 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 20 - 21 |
| **07: අනුකූලතා වාර්තාව** | | 22 - 28 |

වගු

| | | |
|---|---|---|
| 2.1 | රජයට අයත් සමස්ත වාහන සංඛ්‍යාවෙහි වයස් විශ්ලේෂණය | 6 - 6 |
| 2.2 | කුළියට ලබාදී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය | 7 - 7 |
| 2.3 | රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ සාරාංශය | 8 - 8 |
| 2.4 | මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම | 10 - 10 |

# 2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යය සාධන වාර්තාව
# කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
# වැය ශීර්ෂ අංකය 333

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

2017 අයවැය යෝජනාව අනුව, රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය 2017 මාර්තු 07 වන දින පිහිටුවන ලදි. ඒ අනුව, රාජ්‍ය ආයතන (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන) යටතේ පවතින මූල්‍ය නොවන වත්කම් පිළිබඳව යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම සහ නිසි පරිදි ප්‍රයෝජනයට නොගන්නා සම්පත් හඳුනාගනිමින් හා මෙම වත්කම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම තහවුරු කරමින්, රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. රජයේ වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීම, වත්කම් නිසි ලෙස ආරක්ෂා කිරීම සහ වත්කම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් කාර්යක්ෂම ක්‍රමවේදයකට අනුගත වීම සඳහා කටයුතු කිරීමට වෙන් වූ ආයතනයක් නොමැතිවීම හේතුවෙන් රජයේ මූල්‍ය නොවන වත්කම් ඵලදායීව යොදවා ගැනීම පිරිහී ඇති බැවින්, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය රජයේ ප්‍රමුඛතම කාර්යයක් බවට පත් වී ඇත.

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා පහසුකම් සැලසීමට, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කරමින්, අන්තර්ජාලය පදනම් වූ (web-based) මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS), එහි පළමු මොඩියුලය (වාහන මොඩියුලය) ක්‍රියාත්මක කරමින්, 2023 සැප්තැම්බර් 01 දින සිට ස්ථාපිත කර ඇත. මෙම පද්ධතිය මගින්, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා අවශ්‍ය තක්සේරු වටිනාකම ඇතුළු අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් අන්තර්ජාලය පදනම් වූ මධ්‍යගත විස්තීරණ තත්‍ය කාලීන තොරතුරු වාර්තා කරනු ලබන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරනු ලබයි. මෙම NFAMS පද්ධතිය නිර්මාණය, මෘදුකාංග සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම රජයට අමතර වැය බරක් නොමැතිව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත්වල දායකත්වයෙන් සිදු කරනු ලබයි. අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සඳහා වන NFAMS මොඩියුල ක්‍රියාත්මක කිරීම ඉදිරියේදී ක්‍රමානුකූලව සිදු කරනු ලැබේ. තවද, කොම්ප්ට්‍රෝලර් ජනරාල් ආදායම් ගණන් දීමේ නිලධාරී ලෙස, රජයේ අයතනවල ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබිය යුතු ආදායම එකතු කිරීමට කටයුතු කරනු ලබයි.

රජයේ මූල්‍ය නොවන වත්කම් නිසිලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය වත්කම් කළමනාකරණ නීතිය පැනවීමට කටයුතු කරමින් පවතී.

## 1.2. දැක්ම හා මෙහෙවර

### (අ) දැක්ම

රාජ්‍ය අංශයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා ලොව පිළිගත් ඉහළම මට්ටමේ ආයතනයක් වීම.

### (ආ) මෙහෙවර

රජයේ සංවර්ධන රාමුව ශක්තිමත් කරමින් සහ මෙම වත්කම් අපහරණය කිරීමෙන් ලැබිය යුතු ආදායම එකතු කර ගැනීම සුරක්ෂිත කරමින් කටයුතු කරන අතර රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින්, යාවත්කාලීන කරන ලද විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක වාර්තා කර ඇති රාජ්‍ය අංශයේ මූල්‍ය නොවන වත්කම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සහ කළමනාකරණය කිරීම දිරිගැන්වීම.

## 1.3 පරමාර්ථ, ප්‍රධාන ක්‍රියාවන් හා ප්‍රධාන කාර්යයන්

### (අ) පරමාර්ථ:

(i) රජයේ (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන) මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය

- අ. සියලුම මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.
- ආ. මූල්‍ය නොවන වත්කම් ඵලදායී හා කාර්යක්ෂම උපයෝජනය තුළින් රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- ඇ. මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම නිවැරදිව වාර්තා කිරීම තහවුරු කිරීම.
- ඈ. මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ නායකත්ව සහ භාරකාර භූමිකාව ඉටුකිරීම.

(ii) රජයේ ආයතන සතු ප්‍රාග්ධන වත්කම් විකිණීම්වලින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.

### (ආ) ප්‍රධාන ක්‍රියාවන්:

(i) රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය

- අ. සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම හා ලේඛනගත කර පවත්වාගැනීම සඳහා (වත්කම්වල වටිනාකම සහිතව වාර්තා කිරීමට හැකිවන පරිදි) යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) පවත්වාගැනීම සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

ආ. මූල්‍ය නොවන වත්කම් උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කිරීම හා වියදම් කළමනාකරණය සඳහා රජයේ දේපල අනිසි කළමනාකරණය, නාස්තිය හා විනාශ වීමට ඉඩහැරීම වැලැක්වීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම:

(ii) රජයේ ආයතන සතු ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම සඳහා ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස කටයුතු කිරීම.

**(ඇ) ප්‍රධාන කාර්යයන්:**

අ. රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳව විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) ඇතිකිරීම හා යාවත්කාලීන කර පවත්වාගැනීම සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

ආ. ප්‍රතිපත්ති සහ රෙගුලාසි සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම හා චක්‍රලේඛ නිකුත් කිරීම.

ඇ. රජයේ වත්කම් අත්පත් කරගැනීම, පවත්වාගැනීම සහ අපහරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම.

ඈ. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දැනුවත් භාවය වැඩිදියුණු කිරීම සහ මෙම වත්කම් උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කිරීම සඳහා අවශ්‍ය හොඳම භාවිතයන් හඳුන්වාදීම.

ඉ. රජයේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු ලබාදීම.

ඊ. රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන වාහනවල නෛතික අයිතිය පිළිබඳව පවතින ගැටළු නිරාකරණය කිරීම.

උ. රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයන් සපුරාලීමට මූල්‍ය නොවන වත්කම් වෙන්කර දීම.

ඌ. රජයේ ආයතන සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනවල වාහන මිලදීගැනීම සඳහා නිර්දේශ ලබාදීම.

එ. රජයේ ආයෝජන හා රාජ්‍ය මූල්‍ය ශේෂයන් සඳහා සහායවීමට, නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම් හඳුනා ගැනීම සහ අදාල තොරතුරු සැපයීම / රෙගුලාසි නිකුත් කිරීම.

ඒ. රජයේ ආයතන සතු ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම එකතු කිරීම හා වාර්තා කිරීම.

## 1.4 සංවිධාන සටහන




සං.නි. - සංවර්ධන නිලධාරි
ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

## පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය කිරීම තහවුරු කිරීම සඳහා, මෙම වත්කම් පිළිබඳව යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම සහ නිසි පරිදි ප්‍රයෝජනයට නොගන්නා සම්පත් හඳුනාගනිමින් හා මෙම වත්කම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම තහවුරු කරමින් රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

### 2.1. රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා යාවත්කාලීන කළ විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම

පළමු අදියර ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2014 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන අත්පොතෙහි වත්කම් ක්ෂේත්‍ර වර්ගීකරණය පදනම් කර ගනිමින්, රජයේ මූල්‍ය නොවන වත්කම්, එනම් වාහන, ගොඩනැගිලි, ඉඩම්, ඉදිකිරීම්, පිරියත හා යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳව මූලික තොරතුරු රැස් කිරීම සඳහා උපදෙස් ලබාදීම පිණිස 2017 ජූනි 28 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක. 01/2017 නිකුත් කරන ලදී.

#### (අ) විස්තීර්ණ මධ්‍යගත අන්තර්ජාලය පදනම් වූ (web-based) දත්ත පද්ධතියක් හා කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය කිරීම සඳහා විස්තීර්ණ මධ්‍යගත අන්තර්ජාලය පදනම් වූ (web-based) දත්ත පද්ධතියක් හා කළමනාකරණ ක්‍රමවේදයක් ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් තොරතුරු පද්ධතිය (ITMIS) මඟින් ස්ථාපිත කිරීමට දැඩි ප්‍රයත්නයක් දැරුවද එය අසාර්ථක වූ බැවින්, කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය විසින් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව අන්තර්ජාලය පදනම් වූ මධ්‍යගත විස්තීරණ තත්‍ය කාලීන තොරතුරු වාර්තා කරනු ලබන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඒ අනුව, අන්තර්ජාලය පදනම් වූ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කරමින් 2023 සැප්තැම්බර් 01 දින සිට ස්ථාපිත කර ඇත. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය වඩාත් ක්‍රමවත් කිරීම සහ මෙම වත්කම් පිළිබඳ තොරතුරු පවත්වා ගැනීමේ සහ වාර්තා කිරීමේ වගවීම ඉහළ නැංවීම මෙම තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් අපේක්ෂා කෙරේ. තවද, මෙම NFAMS පද්ධතිය මඟින් සෑම රාජ්‍ය ආයතනයකටම ඔවුන්ගේ වත්කම් ලේඛනය අන්තර්ජාලය පදනම් වූ පද්ධතියක (web - based platform) පවත්වාගෙන යාමට සහ මෙම වත්කම් කළමනාකරණයට අවශ්‍ය පහසුකම් සපයනු ඇත. මෙම NFAMS පද්ධතියෙහි පළමු පියවර ලෙස වාහන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කර ඇත. ඉදිකිරීම් මොඩියුලයේ මෘදුකාංග සංවර්ධනය සිදු කෙරෙමින් පවතින අතර අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සඳහා වන NFAMS මොඩියුල හඳුන්වාදීම ඉදිරියේදී ක්‍රමානුකූලව සිදු කරනු ලැබේ.

**(ආ) මධ්‍යගත දත්ත පද්ධතිය - වාහන**

වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කරමින් 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කරන ලද අන්තර්ජාලය පදනම් වූ තත්‍ය කාලීන තොරතුරු වාර්තා කරන මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) යටතේ 2025 මැයි 30 දිනට වාර්තා කර ඇති පරිදි, රාජ්‍ය ආයතන සතු/භාවිතා කරන මුලු වාහන ප්‍රමාණය 93,378 (ධාවනය කල හැකි තත්වයේ පවතින වාහන 89,420 සහ ධාවනය කල නොහැකි තත්වයේ පවතින වාහන 3,958) ක් වේ. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි නොකල ඉදිකිරීම් කර්මාන්තයට භාවිතා කරන වාහන, බෝට්ටු සහ ඉඩම් වාහන වැනි වාහන ද මෙම වාහන ප්‍රමාණයට ඇතුලත් වේ. මෙම වාහන ප්‍රමාණයෙහි විශ්ලේෂණය වාහනවල වයස සහ වර්ගය අනුව පහත සදහන් පරිදි වේ.

වගුව 2.1 : රජයට අයත් සමස්ත වාහන සංඛ්‍යාවෙහි වයස් විශ්ලේෂණය - 2025.05.30 දිනට

| වාහන වර්ගය* | වසර 0 - 5 | වසර 6 - 10 | වසර 11-15 | වසර 15ට වඩා පැරණි | එකතුව |
|---|---|---|---|---|---|
| යතුරු පැදි | 752 | 4,135 | 4,382 | 6,638 | 15,907 |
| කාර් | 717 | 1,962 | 4,852 | 5,282 | 12,813 |
| ද්විත්ව කාර්යය වාහන | 246 | 1,668 | 2,662 | 5,679 | 10,255 |
| බස් | 565 | 1,095 | 2,848 | 2,988 | 7,496 |
| මෝටර් ලොරි | 284 | 1,449 | 1,335 | 3,713 | 6,781 |
| ඉඩම් වාහන | 199 | 987 | 1,571 | 3,192 | 5,949 |
| ඩබල් කැබ් | 168 | 1,001 | 1,519 | 2,256 | 4,944 |
| ත්‍රිරෝද රථ | 2,031 | 422 | 745 | 1,168 | 4,366 |
| ට්‍රැක්ටර් | 358 | 512 | 1,178 | 1,787 | 3,835 |
| මෝටර් කෝච් | 43 | 397 | 738 | 1,288 | 2,466 |
| ට්‍රැක්ටර් ටේලර් / බවුසර් | 901 | 687 | 1,086 | 1,802 | 4,476 |
| ගිලන් රථ | 154 | 680 | 444 | 884 | 2,162 |
| වෑන් | 90 | 563 | 572 | 867 | 2,092 |
| සිංගල් කැබ් | 80 | 453 | 404 | 504 | 1,441 |
| විශේෂ කාර්ය වාහන | 177 | 692 | 297 | 251 | 1,417 |
| ට්‍රක් | 272 | 126 | 401 | 527 | 1,326 |
| අනෙකුත් වාහන | 644 | 1,168 | 1,132 | 2,708 | 5,652 |
| **එකතුව** | **7,681** | **17,997** | **26,166** | **41,534** | **93,378** |

*වාහනයේ වර්ගය (අනෙකුත් වාහන හැර), මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාහන ලියාපදිංචි සහතිකයේ දක්වා ඇති වර්ගීකරණය මත පදනම් වන අතර මෙහි සඳහන් කාර්, ද්විත්ව කාර්යය වාහන අනෙකුත් වාහන වර්ග වලට වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හි සඳහන් සුඛෝපභෝගී කාණ්ඩයේ වාහන ද ඇතුලත් වේ.

මූලාශ්‍රය : කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය






**(ඇ) මධ්‍යගත දත්ත පද්ධතිය - ගොඩනැගිලි**

රජයේ ගොඩනැගිලි පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු රැස්කිරීමට 2022 ජනවාරි මස 03 වන දින චක්‍රලේඛ අංක 01/2022 වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2022 නිකුත් කරන ලදී. ඒ අනුව, රාජ්‍ය ආයතන විසින් වාර්තා කර ඇති පරිදි 2021 දෙසැම්බර් 31 දිනට, කුළියට ලබා දී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය වගුව 2.2 හි සඳහන් පරිදි වේ. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලිවල භාවිතා කරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 57.1ක් හා කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලිවල භාවිතා කරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 2.9ක් වන අතර ඒ සඳහා වැය වූ වාර්ෂික වියදම රු. බිලියන 11.6ක් වේ. මේ අතර, භාවිතා නොකරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 0.8ක් පමණ වේ. තවද, රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලිවල බිම් ප්‍රමාණයෙන් වර්ග මීටර් මිලියන 1.7ක් කුළියට ලබාදී ඇති අතර එමගින් රාජ්‍ය ආයතනවලින් රු. බිලියන 6.2ක හා පෞද්ගලික ආයතනවලින් රු. බිලියන 3.1ක වාර්ෂික ආදායමක් උපයා ඇත.

**වගුව 2.2: කුළියට ලබාදී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය - 2021.12.31 දිනට**

| රාජ්‍ය ආයතනය | භාවිත කරනු ලබන බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | | | භාවිත නොකරනු ලබන බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | .වාර්ෂික කුළී/බදු වියදම (රු. මිලි.) | බදු දී ඇති ස්ථාන | |
|---|---|---|---|---|---|---|---|
| | අයිතිය සතු | කුළියට/ බද්දට | එකතුව | | | බිම් ප්‍රමාණය (වර්ග මීටර්) | වාර්ෂික ආදායම (රු. මිලි.) |
| රජයේ ආයතන සහ රාජ්‍ය ව්‍යාපාර | 46,041,744 | 2,680,256 | 48,722,000 | 596,855 | 11,439.6 | 970,225 | 8,564.2 |
| පළාත් සභා සහ පළාත් පාලන ආයතන | 11,137,528 | 200,502 | 11,338,030 | 188,345 | 148.4 | 721,656 | 749.6 |
| එකතුව | **57,179,272** | **2,880,758** | **60,060,030** | **785,200** | **11,588.0** | **1,691,881** | **9,313.8** |

සටහන: ගරාජ, නිල නිවාස, සංචාරක බංගලා, නිවාඩු නිකේතන සහ අනෙකුත් එවැනි නේවාසික නොවන ගොඩනැගිලිවල තොරතුරු මෙම තොරතුරු වලට ඇතුලත් නොවේ.

NFAMS පද්ධතිය යටතේ වන ගොඩනැගිලි මොඩියුලය ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ අනුව, යාවත් කාලීන කල ගොඩනැගිලි දත්ත පද්ධතිය සකස් කරනු ලැබේ.

**(ඈ) මධ්‍යගත දත්ත පද්ධතිය - ඉඩම්**

රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු රැස්කිරීමට 2022 ජනවාරි මස 07 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2022 නිකුත් කරන ලදී. ඒ අනුව, ඇතැම් රාජ්‍ය ආයතන විසින් තොරතුරු ඉදිරිපත් කරන ලද අතර, රාජ්‍ය ආයතන 740ක් විසින් එම තොරතුරු නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණි. තවද, රාජ්‍ය ආයතන 395ක් විසින් ඉඩම් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණි.

වගුව **2.3:** රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ සාරාංශය-**2021.12.31** දිනට

| රාජ්‍ය ආයතනය / ඉඩම් භාවිතය | | ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|
| **රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය** | | **1,490,951** |
| | එයින් වනාන්තර | 1,125,700 |
| **i** | **භාවිත කරනු ලබන** | **1,474,712** |
| | රජයේ ආයතන | 1,404,656 |
| | රාජ්‍ය ව්‍යාපාර | 49,563 |
| | පළාත් සභා හා පළාත් පාලන ආයතන | 20,493 |
| **ii** | **භාවිත නොකරනු ලබන** | **13,701** |
| | රජයේ ආයතන | 8,826 |
| | රාජ්‍ය ව්‍යාපාර | 4,468 |
| | පළාත් සභා හා පළාත් පාලන ආයතන | 407 |
| **iii** | **භාවිතය පිළිබඳව සඳහන් කර නොමැති** | **2,538** |
| | රජයේ ආයතන | 1,147 |
| | රාජ්‍ය ව්‍යාපාර | 1,097 |
| | පළාත් සභා හා පළාත් පාලන ආයතන | 294 |

2021 දෙසැම්බර් 31 දිනට පැවති රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ තොරතුරුවල සාරාංශය වගුව 2.3හි සඳහන් පරිදි වේ. ඒ අනුව, රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබාදී ඇති මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර මිලියන 1.49ක් වන අතර එයින් හෙක්ටයාර මිලියන 1.12ක් වනාන්තරවලින් වැසුනු ඉඩම් වේ. වාර්තා කර ඇති ඉඩම් ප්‍රමාණය තුල භාවිතා කරනු ලබන ඉඩම් හෙක්ටයාර මිලියන 1.47ක් හා භාවිතා නොකරනු ලබන ඉඩම් හෙක්ටයාර 13,702ක් ඇතුලත් වේ. ඉඩම් හෙක්ටයාර 2,537ක ප්‍රමාණය භාවිතා කිරීම පිළිබඳව රාජ්‍ය ආයතන විසින් වාර්තා කර නොමැත.

NFAMS පද්ධතිය යටතේ වන ඉඩම් මොඩියුලය ඉදිරියේදී ක්‍රියාත්මක කරන අතර ඒ අනුව යාවත්කාලීන ඉඩම් දත්ත පද්ධතිය සකස් කරනු ලැබේ.

## 2.2. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

### (අ) රජයේ වාහන ප්‍රසම්පාදනය කළමනාකරණය කිරීම

2019 වසර මැද සිට, රජයේ ආයතන සඳහා උපයෝගීතා වාහන හැර අනෙකුත් මෝටර් වාහන ප්‍රසම්පාදනය තාවකාලිකව අත්හිටුවමින් 2019 සැප්තැම්බර් 24 වන දින ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2019 නිකුත් කර ඇත. ඒ අනුව, සංවර්ධන කටයුතු සහ අනෙකුත් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා අවශ්‍ය උපයෝගීතා වාහන සහ ශ්‍රී ලංකා පොලීසියේ භාවිතය සඳහා ආනයනය කරන ලද වාහනද හැර, රජයට අමතර වැය බරක් නොවෙමින් රජයේ වාහන අවශ්‍යතාවය සපුරාලීමට පැවති වාහන ප්‍රමාණය භාවිතා කරමින් කළමනාකරණය කරන ලදී. රජයේ පවතින උපයෝගීතා වාහන වල ඵලදායී භාවිතය හා අවශ්‍යතාවය හඳුනාගනිමින්, උපයෝගීතා වාහන ප්‍රසම්පාදනය සඳහා 2024 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ඉල්ලීම් 54 ක් අතරින් උපයෝගීතා වාහන 46 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබා දී ඇත.

**(ආ) රජය සතු මෝටර් වාහන වල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කරගැනීම**

ඇතැම් රාජ්‍ය ආයතන භාවිතා කරන වාහන සැලකිය යුතු ප්‍රමාණයක නීත්‍යානුකූල අයිතිය එම ආයතන සතු නොවන අතර නීත්‍යානුකූල අයිතිය වෙනත් ආයතනයක් සතු වන බව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් හඳුනාගන්නා ලදී. එබැවින්, මෝටර් වාහන වල ලියාපදිංචි අයිතිය නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙමින් 2017 දෙසැම්බර් 21 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හා 2018 ඔක්තෝම්බර් 10 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2018 නිකුත් කරන ලදී. මෙලෙස, 2024 වර්ෂයේ දී වාහන 319 ක ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිරාකරණය කර ඇත. ඒ අනුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වාහන 982 ක ලියාපදිංචි හිමිකාරිත්වය පිළිබඳ ගැටළු නිරාකරණය කර ඇත.

**(ඇ) රාජ්‍ය ආයතනවල පවතින විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම**

2024 දෙසැම්බර් 02 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයට අනුව, රාජ්‍ය ආයතනවල පවතින භාවිතය ආර්ථිකයමය වශයෙන් ඵලදායි නොවන හා එම ආයතනවල භාවිතයට අවශ්‍ය නොවන එන්ජින් ධාරිතාව 1800 CC ට වැඩි පෙට්‍රල් වාහන / එන්ජින් ධාරිතාව 2300 CC ට වැඩි ඩීසල් වාහන (ඩබල් කැබ්. සිංගල් කැබ්, වෑන්, බස්, ලොරි හා ට්‍රක් යනාදිය හැර) අදාල ආයතනයේ වාහන අවශ්‍යතාව තක්සේරු කිරීමෙන් අනතුරුව අපහරණය කිරීම සඳහා සියළුම රාජ්‍ය ආයතනවලට උපදෙස් ලබා දෙමින් 2024 දෙසැම්බර් 18 දිනැතිව වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 නිකුත් කරන ලදී.

**(ඈ) ධාවන තත්ත්වයේ නොමැති වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම**

රජයේ වාහන විනාශවීම සහ රජයේ ආදායම අහිමි වීම වැළැක්වීම සඳහා මෙම වාහන නිසි ලෙස භාවිතා කිරීම හා නියමිත වේලාවට අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම සහතික කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා, සියලුම රාජ්‍ය ආයතන වලට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් 2020 ඔක්තෝබර් 02 වැනි දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 නිකුත් කර ඇත. වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 සහ අංක 05/2024 මගින් ද, නිසි නඩත්තුව සහ නොසැලිකිලිමත් භාවිතය වැලක්වීමෙන් වාහන නිසි ලෙස භාවිත කිරීමේ සහ අදාල උපදෙස් පිළිපැදීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත.

**(ඉ) මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශය**

1992 වර්ෂයේදී නිකුත් කල රජයේ මුදල් රෙගුලාසි හෝ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කල චක්‍රලේඛ මගින් රජයේ වාහන, ගොඩනැගිලි, ඉඩම්, ඉදිකිරීම් පිරියත හා යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීම සඳහා උපදෙස් ලබා දී නොතිබුණි. එබැවින්, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, 02/2019 සහ 05/2021 මගින් මෙම වත්කම් තක්සේරු කිරීම සඳහා වන ප්‍රතිපත්තිය සකස් කරන ලදී. එම චක්‍රලේඛ මගින් වාහනවල වටිනාකම තක්සේරු කිරීම සඳහා ලබා දුන් උපදෙස් ද ඇතුලත් කරමින්, වාහනවල වටිනාකම තක්සේරු කිරීම සඳහා වන උපදෙස් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2024 මගින් ලබා දී ඇත. සියළුම මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) තුල වාර්තා කරනු ලැබේ.

## 2.3. ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම

2018 මාර්තු 22 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(xii) අනුව, 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම් ගිණුම් තැබීම සඳහා ගණන්දීමේ නිලධාරී ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් පත් කර ඇත. මේ සඳහා, 2025 වර්ෂයට අදාළ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම හා 2024 වර්ෂයට අදාල සංශෝධිත ඇස්තමේන්තු ලබාගැනීමට අදාල ආයතන වලට උපදෙස් ලබාදීම සඳහා 2024 මැයි 28 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2024 නිකුත් කරන ලදි. තවද, 2024 වර්ෂයේ ජූනි 30 දිනට හිඟ ආදායම්, මුල් මාස හය තුළ රැස්කළ හිඟ ආදායම් හා අදාල කාල පරිච්ඡේදය තුළදී අත්හරිනු ලැබූ ආදායම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා 2024 ජූනි 05 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2024 හා 2024 වර්ෂය තුළ රැස්කළ හිඟ ආදායම් හා අදාල කාල පරිච්ඡේදය තුළදී අත්හරිනු ලැබූ ආදායම් පිළිබඳ තොරතුරු ලබාගැනීමට 2024 දෙසැම්බර් 19 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2024 නිකුත් කරන ලදී.

**වගුව 2.4: ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම (රු. මිලියන)**

| විස්තරය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් විකිණීම් - වාහන | 201.0 | 128.3 | 226.4 | 329.6 | 136.0 |
| ප්‍රාග්ධන වත්කම් විකිණීම් - වෙනත් | 56.0 | 60.1 | 357.8 | 186.3 | 974.1 |
| **එකතුව** | **257.0** | **188.4** | **584.2** | **515.9** | **1110.1** |

2023 වර්ෂයේදී රුපියල් මිලියන 329.6 ක් වූ වාහන විකිණීමෙන් ඉපයූ ආදායම 2024 වර්ෂයේදී රුපියල් මිලියන 136.0 දක්වා අඩු වී ඇත. කෙසේ වෙතත්, අනෙකුත් වත්කම් විකිණීමෙන් 2023 වර්ෂයේදී ඉපයූ රුපියල් මිලියන 186.3 ක ආදායමට සාපේක්ෂව 2024 වර්ෂයේදී එම ආදායම රුපියල් මිලියන 974.1 දක්වා වැඩි වී ඇත. ඒ අනුව, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් 2023 වර්ෂයේදී ඉපයූ රුපියල් මිලියන 515.9 ක මුළු ආදායමට සාපේක්ෂව 2024 වර්ෂයේ දී එම ආදායම රුපියල් මිලියන 1110.1 ක් දක්වා වැඩි වී ඇත. ඒ අනුව, 2024 වර්ෂයේදී මෙම මුළු ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය මූලික මුළු ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව 370% ක් වේ.

## 2.4 අභියෝග සහ අනාගත අරමුණු

I. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා මධ්‍යගත මාර්ගගත (online) කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පැවති බාධාවන් හා අභියෝග ජයගනිමින්, මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) 2023 සැප්තැම්බර් 01 දින සිට ස්ථාපිත කර ඇත. මෙම NFAMS පද්ධතිය නිර්මාණය, මෘදුකාංග සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම, වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත්වල දායකත්වයෙන් සිදු කරනු ලැබේ. මෙහි පළමු අදියර ලෙස වාහන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කර ඇත. අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සඳහා වන NFAMS මොඩියුල ක්‍රියාත්මක කිරීම ඉදිරියේදී ක්‍රමාණුකූලව සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, NFAMS පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පද්ධතියෙහි තොරතුරු නිවැරදිව තත්‍ය කාලීනව වාර්තා කිරීම සඳහා වන සියළු රාජ්‍ය ආයතනවල අනුගත වීම වැඩිදියුණු කර ගැනීම තවදුරටත් අභියෝගාත්මක වේ.

II. NFAMS කළමනාකරණ තොරතුරු පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කරමින් රාජ්‍ය ආයතනවල (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන) මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා පහසුකම් සැපයීමට සහ යාවත්කාලීන කළ තොරතුරු මත පදනම්ව මෙම වත්කම් අපහරණය, ආදායම් ඉපයීම, වියදම් කළමනාකරණය සහ භාවිතයට නොගන්නා හා ඌන උපයෝජන වත්කම් ඵලදායීව යොදාගැනීම ඇතුලත්ව මෙම වත්කම් කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ නිකුත් කරමින් රාජ්‍ය ආයෝජනයට පහසුකම් සපයමින් රජයේ සංවර්ධන රාමුව ශක්තිමත් කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමට සහාය වීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා සියළු රාජ්‍ය ආයතනවල සහයෝගය අවශ්‍ය වන අතර එය අභියෝගාත්මක වේ.

III. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය ස්ථාපිත කිරීමේ සිට අවශ්‍ය කාර්යමණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීම සඳහා වන බාධාවන් හේතුවෙන් අවශ්‍ය කාර්යමණ්ඩලය නොමැති වීම හේතුවෙන් මෙම ආයතනයේ කටයුතු පවත්වා ගැනීම අභියෝගාත්මක වී ඇත.

කොම්ප්ට්‍රෝලර් ජනරාල්

## පරිච්ඡේදය 03 - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 | | සටහන | තතය 2024 | 2023 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | 1,110,150,162 | 515,895,718 | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 1,110,150,162 | 515,895,718 | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **1,110,150,162** | **515,895,718** | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 45,789,000 | 43,466,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 133,392 | 48,827 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 4,178,005 | 2,268,828 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **50,100,397** | **45,783,655** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,160,250,559** | **561,679,373** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 579,105 | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **1,159,671,454** | **561,679,373** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 32,200,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 29,279,516 | 28,322,522 | ඒසීඒ-2(ii) |
| 17,580,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 14,832,517 | 15,339,189 | ඒසීඒ-2(ii) |
| 250,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 215,139 | 246,042 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| **50,030,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **44,327,172** | **43,907,753** | |
| | **මූලධන වියදම්** | | | | |
| 815,200 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 814,982 | 433,551 | ඒසීඒ-2(ii) |
| 2,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 1,909,767 | 1,126,251 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 497,000 | 187,940 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | ඒසීඒ-2(ii) |
| **3,315,200** | **මුළු මූලධන වියදම් (උ)** | | **3,221,749** | **1,747,742** | |
| | තැන්පතු ගෙවීම් | | 133,392 | 48,827 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 3,949,656 | 2,140,586 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **4,083,048** | **2,189,413** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **51,631,969** | **47,844,908** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **1,108,039,485** | **513,834,465** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | 1,108,039,485 | 513,834,465 | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | ඒසීඒ-3 |
| | | | **1,108,039,485** | **513,834,465** | |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 15,162,292 | 13,515,736 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 4,893,547 | 5,121,896 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **20,055,839** | **18,637,632** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 4,893,547 | 5,121,896 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 15,162,292 | 13,515,736 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **20,055,839** | **18,637,632** |

පිටු අංක 07 සිට 26 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ……………………… | ……………………… | ……………………………………… |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : කේ.එම්.මහින්ද සිරිවර්ධන | නම : කේ. ඒ. රම්‍යා කාන්ති | නම : |
| තනතුර : මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01. | තනතුර : කොම්ප්ට්‍රොලර් ජනරාල්, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය, මහා භාණ්ඩාගාරය, කොළඹ 01 | අධ්‍යක්ෂ, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය, මහා භාණ්ඩාගාරය, කොළඹ 01. |
| දිනය : 2025.02.27 | දිනය : 2025.02.20 | දිනය : 2025-02-20 |

2

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | තකය | |
|---|---|---|
| | **2024** රු. | **2023** රු. |
| <u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 1,840,829 | 1,503,071 |
| අග්‍රිම ලැබීම් | 45,789,000 | 43,466,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 4,455,614 | 2,531,710 |
